# ගෙඹි කරදරේ

කන්ද උඩරට රාජසිංහ රජ්ජුරුවන්ගෙ මල් උයන හරි ලස්සනයි. ඒ උයනෙ තිබුණා ඕලු, මානෙල්, නෙළුම් මල්වලින් පිරුණු විලක්. විලේ ජීවත් වුණා ගෙම්බෙක්. රෑ තිස්සෙ ම ඒ ගෙම්බා තොරතෝංචියක් නැතුව "බක බක" ගාලා කෑගහනවා. ගෙම්බගෙ මේ සද්දෙ හින්දා රජ්ජුරුවන්ට රෑට නින්ද යන්නෙ නෑ. ගෙඹි සද්දෙ මහ කරදරයක් වුණා.

ඉතින් මේ ගෙඹි කරදරේ නැති කරලා දමන්න හැම උත්සාහයක් ම ගත්තා. ඒත් බැරි වුණා කරදරේ නැති කරන්න. අන්තිමේ දී රට පුරා අණ බෙර ගහලා දැන්නුවා ඒ ගෙඹි කරදරේ නතර කරපු කෙනාට හුඟක් වටිනා තෑගි බෝග දෙනවා කියලා.

මේ ආරංචිය අන්දරේ ජීවත් වුණු රුහුණු පළාතටත් පැතුරුණා. ඉතින් අන්දරේට හිතුණා, ඒ ගෙඹි කරදරේ නවත්තන්න ඔහුට පුළුවන් කියලා. එහෙම හිතාගෙන කන්ද උඩරට රජවාසල බලා පිටත් වුණා.

අන්දරේ රජ්ජුරුවන් බැහැ දැකලා ආපු කාරණේ කිව්වා.

"මේ වැඩේ තොපට කරන්න පුළුවන් කියලා ද හිතන්නෙ?" රජ්ජුරුවෝ ඇහුවා.

"එහෙමයි දේවයන්වහන්ස, මට පුළුවනි," අන්දරේ හුඟක් යටහත් පහත් ව, ගරුසරු ඇති ව කිව්වා.

"මේ වැඩේ කරන්න තොපට ඕනෑ කරන්නෙ මොනවා ද?" රජ්ජුරුවෝ ඇහුවා.

"දේවයන් වහන්ස, මට හොඳ දුන්නකුයි, ඊතලයි ලබා දෙන්න," අන්දරේ කිව්වා.



රජ්ජුරුවො රාජපුරුෂයන්ට අණ කළා අන්දරේට ඕනෑ දේවල් ලබා දෙන්ට.

ඉතින් ඉර බැහැගෙන යන වෙලේ දුන්නයි, ඊතලයි අරගෙන අන්දරේ හෙමින් සැරේ ගියා විල ළඟට. හොඳට "හරි-බරි" ගැහිලා ලක ලෑස්ති වෙලා හිටියා. එදත් කළුවර වැටීගෙන එද්දි ගෙම්බා පුරුදු විදියට "බක, බක" ගාලා කෑගහන්න පටන් ගත්තා.

අන්දරේ කලබල වුණේ නෑ. හුඟක් සෝදිසියෙන් ගෙම්බගෙ කෑගැහිල්ලට කන් දීගෙන හිටියා.

සෑහෙන වෙලාවක් ඒ "බක බක" සද්දෙට කන් දීගෙන ඉඳලා, සද්දෙ එන්නෙ හරියට ම කොතැනින් ද කියලා තේරුම් ගත්තා. හැබැයි ඇහැට පෙනිලා නෙමේ - කළුවරේ නේ !

අන්දරේ හෙමිහිට දුන්න අතට අරන් ඊතලයකුත් දුන්නට තියලා සද්දෙ එන තැනට හොඳට කුරුමාණම් අල්ලලා විද්දා. ඒ ඊතලය හරියට ම ඉලක්ක කරපු ගෙම්බාට වැදුණා.

එක පාරට ම ගෙම්බාගෙ "බක - බක" සද්දෙ නැවතුණා. කිසි ම සද්දයක් වත් ඇහෙන්න නෑ.

ගෙඹි කරදරේ හින්දා නින්ද නැතුව සිරි යහනේ ඒ අත මේ අත හැරෙමින් හිටිය රජ්ජුරුවන්ට තේරුණා ඇති වුණු වෙනස. කෝ ! ගෙඹි සද්දෙ නෑ. වෙන කිසි ම සද්දයක් වත් නෑ. රජ්ජුරුවන්ගෙ හිතට ඇති වුණේ ලොකු සතුටක්. ඒ සන්තෝසෙට රජ්ජුරුවන්ට හොඳට ම නින්ද ගියා.

පහුව දා රජ්ජුරුවන් නැඟිට්ටෙ හරි ම සනීපයක් ඇතිව. රාජ සභාවට එතුමා ගියේ හරි සතුටින්. මුලින් ම එතුමා අන්දරේ කැඳෙව්වා.

"තොප ගෙම්බට විද්දෙ කොහොම ද?" රජ්ජුරුවො ඇහුවා.

"දේවයන් වහන්ස, පළමුවෙන් ගෙම්බා කෑගහන සද්දෙට මම හොඳට කන් දුන්නා. පස්සෙ සද්දෙ එන තැන හරියට ම මෙතැනයි කියලා හිතා ගෙන එතැනට හොඳට කුරුමාණම අල්ලලා ඊතලේ විද්දා. ඒ පාරින් ම ගෙම්බා මැරුණා," අන්දරේ විස්තර කළා.